Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

ශ්‍රේණිය : 6 | විෂය : ගණිතය | සතිය : 22

**පාඩම :- දශම**

**කාලච්ඡේද ගණන :- 06**

- පහත දැක්වෙන එක් එක් රූපයේ අඳුරු කර ඇති පෙදෙස මුළු රූපයෙන් භාගයක් ලෙස ලියන්න.



| 1ක් සමාන කොටස් 10 කට බෙදා ලබාගත් එක් කොටසක් $\frac{1}{10}$ වේ. $\frac{1}{10}$ ලියන තවත් ආකාරයක් 0.1 වේ. |
|---|


- පෙලපොතේ 10, 11 පිටු හොඳින් අධ්‍යයනය කරන්න.
- දශම සංඛ්‍යාවක එකස්ථානය, දශම තිත, පළමු දශමස්ථානය නිවැරදිව හඳුනාගන්න.

පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| සංඛ්‍යාව | වචනයෙන් ලියන ආකාරය |
|---|---|
| 0.2 | |
| 0.5 | |
| 1.7 | |
| 2.8 | |
| 13.4 | |

පහත දැක්වෙන දශම සංඛ්‍යා ගණක රාමු මඟින් නිරූපණය කරන්න.


උදා:- 21.3




1) 0.3 2) 1.4 3) 13.2 4) 21.5

පෙලපොතේ 12 පිටුව බලන්න. 13.1 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. මතුවන ගැටළු නිවැරදි කරගැනීමට ගුරුතුමා/ ගුරුතුමිය ගේ සහය ලබා ගන්න.

රූපයේ අඳුරු කර ඇති A, B, C මඟින් දැක්වෙන කොටස් මුළු රූපයෙන් භාගයක් ලෙස ලියන්න.




A = ................


B = ..................

C = ..................

> 1ක් සමාන කොටස් 100 කට බෙදා ලබාගත් එක් කොටසක් $\frac{1}{100}$ වේ. $\frac{1}{100}$ ලියන තවත් ආකාරයක් 0.01 වේ.


- පෙළපොතේ 13 පිටුව නිවැරදිව අධ්‍යයනය කරන්න.

ඒ අනුව පහත සංඛ්‍යාවේ එක් එක් ඉලක්කමේ ස්ථානය නිවැරදිව අවබෝධ කරගන්න.




පහත දැක්වෙන දශම සංඛ්‍යා ගණක රාමු මඟින් නිරූපණය කරන්න.

උදා:- 21.34




1) 13.21 2) 24.01 3) 12.23 4) 41.04

පහත දැක්වෙන A කොටුවේ ඇති එක් එක් භාගයට අදාල දශම සංඛ්‍යාව B කොටුවෙන් තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| $\frac{7}{10}$ | 0.02 |
| $\frac{2}{100}$ | 0.7 |
| $\frac{3}{10}$ | 0.2 |
| $\frac{7}{100}$ | 0.3 |
| $\frac{2}{10}$ | 0.07 |

පෙලපොතේ 15 පිටුවේ නිදසුන 1 නිවැරදිව අධ්‍යයනය කරන්න. 15 පිටුවේ දැක්වෙන ක්‍රියාකාරකම 1 නිවැරදිව සම්පූර්ණ කරන්න.

පෙලපොතේ 15 පිටුවේ 13.2 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. ඔබට මතුවන ගැටළු ගුරුතුමා / ගුරුතුමිය සමඟ සාකච්ඡා කොට නිවැරදි කරගන්න.

පෙලපොතේ 16,17 පිටු නිවැරදිව අධ්‍යයනය කරන්න. ඒ අනුව පහත දැක්වෙන සංඛ්‍යා < හෝ > යොදා සම්බන්ධ කරන්න.

වැඩි > අඩු

1) $\frac{1}{10}$ ........ $\frac{3}{10}$ 2) $\frac{5}{10}$ ........ $\frac{7}{10}$ 3) $\frac{7}{10}$ ........ $\frac{5}{10}$

4) $\frac{12}{100}$ ........ $\frac{25}{100}$ 5) $\frac{3}{100}$ ........ $\frac{5}{100}$ 6) $\frac{18}{100}$ ........ $\frac{9}{100}$

පහත දැක්වෙන දශම සංඛ්‍යා දහයෙන් පංගු ලෙස දක්වා සංසන්දනය කරන්න.

උදා:- 0.3 හා 0.7

$0.3 = \frac{3}{10}$ $0.7 = \frac{7}{10}$

$\frac{3}{10} < \frac{7}{10}$ බැවින් $0.3 < 0.7$ වේ.

1) 0.4 හා 0.6 2) 0.2 හා 0.3 3) 0.8 හා 0.7 4) 0.5 හා 0.4

පහත දැක්වෙන දශම සංඛ්‍යා සියයෙන් පංගු ලෙස දක්වා සංසන්දනය කරන්න.

උදා:- 0.25 හා 0.34

$0.25 = \frac{25}{100}$ $0.34 = \frac{34}{100}$

$\frac{25}{100} < \frac{7}{10}$ බැවින් 0.25 < 0.34 වේ.

1) 0.35 හා 0.53 2) 0.12 හා 0.32 3) 0.03 හා 0.05 4) 0.07 හා 0.09

0.5 හා 0.25 සංසන්දනය කරන්න.

$0.5 = \frac{5}{10}$ $0.25 = \frac{25}{100}$

$\frac{5}{10} = \frac{5 \times 10}{10 \times 10} = \frac{50}{100}$

$\frac{25}{100} < \frac{50}{100}$ බැවින් 0.25 < 0.5 වේ.

පහත දැක්වෙන දශම සංඛ්‍යා සංසන්දනය කරන්න.

1) 0.7 හා 0.12
2) 0.5 හා 0.85
3) 0.4 හා 0.35
4) 0.65 හා 0.9

පෙළපොතේ 18 හා 19 පිටුවල නිදසුන 1,2,3 නිවැරදිව අධ්‍යයනය කරන්න.

19 පිටුවේ 13.3 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. මතුවන ගැටළු නිවැරදි කර ගැනීමට උත්සහ කරන්න.

පෙළපොතේ 20 හා 21 පිටු නිවැරදිව අධ්‍යයනය කරන්න.

දශම සංඛ්‍යාවකට අශම සංඛ්‍යාවක් එකතු කිරීම පිළිබඳව නිවැරදිව අවබෝධ කරගන්න.

උදා :- 0.3 + 0.5

$\frac{3}{10} + \frac{5}{10} = \frac{8}{10} = 0.8$

0.3 + 0.5

0.8

1) 0.7 + 0.1 2) 0.2 + 0.5 3) 0.4 + 0.3 4) 0.2 + 0.6

$$
\begin{array}{r}
2.35 \\
+\ 1.41 \\
\hline
3.76 \\
\hline\hline
\end{array}
$$

22 පිටුවේ 13.4 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.

22 පිටුවේ දශම සංඛ්‍යා අඩු කිරීම පිළිබඳව නිවැරදිව අධ්‍යයනය කරන්න.

| |
|---|
| දශම සංඛ්‍යා එකතු කිරීමේදී හා අඩු කිරීමේදී එම සංඛ්‍යාවල එක් එක් ස්ථානයේ ඉලක්කම්වලින් නිරූපණය වන අගය සලකමින් ගණිත කර්ම සිදුකල යුතුය. |

24 පිටුවේ 13.5 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. ඔබට මතුවන ගැටළු ගුරුතුමා / ගුරුතුමිය සමඟ සාකච්ඡා කර නිවැරදි කරගන්න.